**දෙහිඕවිට ප්‍රාදේශීය සභාව**

**කෑගල්ල දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මැයි 23 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 31 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කල මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු කුලී ආදායම් රු. 261,450 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණය හිමියෝ රු. 378,106 ක් ලෙස දක්වා තිබුණද සත්‍ය වටිනාකම රු. 297,935 ක් වූයෙන් ණය හිමියෝ රු. 80,171 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2016 භාණ්ඩ සමීක්ෂණයෙන් ඉවත් කරන ලද භාණ්ඩ වල වටිනාකම රු. 148,950 ක් ගිණුම් වලින් ඉවත්කිරීමට කටයුතු නොකිරීම නිසා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ගිණුම සහ ප්‍රාග්ධනයට ආදායමින් දායක වීමේ ගිණුම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) 2017 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු උසාවි දඩ මුදල් රු. 15,082,822 ක් වුවත් එය රු. 9,958,326 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා ලැබිය යුතු උසාවි දඩ රු. 5,124,496 කින් අඩුවෙන් දැක්වුණි.

(ඉ) අවස්ථා දෙකකදී පුස්තකාල පොත් මිලදී ගැනීමේදී ලැබී තිබුණු රු. 61,715 ක වට්ටම්, ලැබූ වට්ටම්, වියදම්, පුස්තකාල පොත් හා ප්‍රාග්ධනයට ආදායමෙන් දායකවීමේ ගිණුම් වල අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) වටිනාකම රු. 13,515,000 ක් වටිනා මෝටර් රථ 3 ක් ගිණුම්ගත නොකිරීම නිසා මෝටර් රථ හා කරත්ත ගිණුම හා ප්‍රාග්ධනයට ආදායමෙන් දායක වීමේ ගිණුම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයට අදාල ජ,නල් සටහන් 03 ක් ගිණුම්ගත නොකිරීම නිසා ණයහිමියෝ රු.242,488 කින් වැඩියෙන් හා සමුච්චිත අරමුදල එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) ඉන්වෙන්ට්‍රි ලේඛනයට අනුව පැවති රු. 3,141,410 ක් වටිනා ඉන්වෙන්ට්‍රි විෂයයන් 12 ක් යන්ත්‍ර හා උපකරණ හා ප්‍රාග්ධනයට ආදායමෙන් දායක වීමේ ගිණුම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි

(එ) යන්ත්‍ර උපකරණ විෂයයන් 04 ක වටිනාකම ගණනය කර ගිණුම්ගත නොකිරීම නිසා යන්ත්‍ර හා උපකරණ ගිණුම සහ ප්‍රාග්ධනයට ආදායමෙන් දායක වීමේ ගිණුම අඩුවෙන් දැක්වුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය තුල අරමුදල් ප්‍රභවයන් 09 ක් යටතේ ලැබී තිබුණු රු. 23,369,929 ක් හා ලැබිය යුතු රු. 61,440,413 ක් ප්‍රාග්ධන ආධාර, තැන්පත් ලැබීම් හා තැන්පත් ගෙවීම් යටතේ ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් රු. 84,810,342 ක් අඩුවෙන් හා 2017 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයගැතියෝ හා ණයහිමියෝ රු. 61,440,413 කින් අඩුවෙන් දැක්වුණි.

1.3.2 නොසැසඳුණු ගිණුම්

ගිණුම් විෂයයන් 05 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු. 12,831,098 ක් වූ අතර, ඒවාට අදාල උපයෝගී ලේඛන/වාර්තා අනුව ශේෂයන්ගේ එකතුව රු. 9,589,280 ක් වූයෙන් රු. 3,241,818 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 අවිනිශ්චිත ගිණුම

2009 වර්ෂයේ සිට පැවත එන අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය වූ රු.4,552 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම

සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 01 ඉක්ම වූ ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු.15,634,657 ක් විය.

(ආ) ගෙවිය යුතු ගිණුම්

2010/11 වර්ෂ වලදී රැස්කළ එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු හා රඳවා ගැනීමේ බදු එකතුව රු. 3,015,033 ක් 2017 දෙසැම්බර් 31 දින වනවිටත් දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය නොකර ගෙවිය යුතු ගිණුම් වල දක්වා තිබුණි.

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 158 හා 159 වගන්ති | 2,347,087 | 2017 දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු හිගය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 67හා 68 වගන්ති හා අංක 1597/8 හා 2009 අප්‍රේල් 17 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය | - | ඉදිකරනු ලබන සෑම ගොඩනැගිල්ලක්ම ප්‍රයෝජනයට ගැනීමට ප්‍රථම අනුකූලතා සහතිකයක් ලබා ගතයුතු අතර එසේ නොමැතිව ප්‍රයෝජනයට ගතහොත් දිනකට රු. 50 බැගින් ගාස්තුවක් අයකළ යුතු වුවත් සභාවේ ලියාපදිංචි කරනු ලබන ගොඩනැගිලි අයදුම්පත් වලට සම්බන්ධ අනුකූලතා සහතික නිකුත් කිරීම් සියයට 10 ත් ,සියයට 18 ත් අතර පරාසයක විය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| | (i) මු.රෙ.371 (2) ආ | 112,250 | අවස්ථා 03 කදී ලබාදෙන ලද අත්තිකාරම් 2017 දෙසැම්බර් 31 දින වනවිටත් පියවා නොතිබුණි. |
| | (ii) මු.රෙ. 396 (ඇ) | 29,865 | නිකුත්කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ මාස 06 ක් ඉක්මවූ චෙක්පත් 08 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| | (iii) මු.රෙ. 571 | 2,150,567 | 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාල තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| | (iv) මු.රෙ.880 සිට 893 දක්වා | 29,000 | ඇප තැබිය යුතු නිලධාරින් විසින් සේවක ඇප තබා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය XXIV වන පරිච්ඡේදයේ 1.6 වගන්තිය | 74,626 | ස්ථාන මාරුවීම් ලබාගිය සේවකයන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඉ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | වාහන 03 කට අදාලව ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචන
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම වූ රු.9,295,006 ක් වූ අතර,ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,806,397 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
------------------------

2.2.1 ඇස්තමේන්තු ගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්
------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 3,230,700 | 3,295,460 | 4,629,781 | 4,468,378 | 3,540,000 | 3,734,280 | 4,351,140 | 5,867,568 |
| (ii) කුලී | 8,186,792 | 5,761,318 | 5,942,348 | 1,491,615 | 6,569,200 | 5,506,040 | 4,562,103 | 2,049,018 |
| (iii) බලපත්‍රගාස්තු | 800,000 | 669,600 | 672,350 | 96,518 | 800,000 | 671,210 | 686,850 | 99,268 |
| (iv) වෙනත් ආදායම් | 53,602,300 | 45,487,931 | 40,228,387 | 33,967,108 | 58,722,000 | 41,357,202 | 33,938,899 | 25,822,873 |

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

--------------------------------------

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් හා බදු, ආදායම් විෂයයේ රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා සියයට 43 න් වැඩි වී තිබුණු අතර කුලී, බලපත්‍ර ගාස්තු හා වෙනත් ආදායම් යන ආදායම් විෂයයන්ගෙන් රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 27, 16, හා 25 කින් අඩුවී තිබුණි.

2.2.3 වරිපනම් හා බදු

--------------------

වරිපනම් දේපල අවම වශයෙන් වර්ෂ 05 කට වරක්වත් තක්සේරු කර බදු අයකලයුතු වුවත් 2008 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයටද වරිපනම් බදු අයකරගෙන තිබුණි.

2.2.4 කුලී

----

දෙහිඕවිට නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 26 කින් 08 ක් පමණක් විවෘත කර තිබුණු අතර ඉදිකිරීම වල පවත්නා අඩුපාඩු හේතුවෙන් කඩ කාමර 18 ක් වසා තිබීම නිසා සමාලෝචිත වර්ෂයේදී සභාවට ලැබිය යුතු රු. 2,171,500 ක ආදායමක් අහිමි වී තිබුණි. එසේම පළමු මහලේ බැංකු පවත්වාගෙන යාමට වර්ග මීටර් 319.5 කින් යුත් පරිශ්‍ර 03 ක් වෙන්කර තිබුණද වැසිකිළි පහසුකම් නොමැතිවීම මත බැංකු විසින් එම පරිශ්‍ර කුලියට නොගැනීම නිසා රු. 12,000,000 ක එක්වන් මුදල් හා රු. 305,000 ක කුලී ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

2.2.5 බලපත්‍ර ගාස්තු

---------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සංචාරක මණ්ඩලයේ අනුමත හෝටලයකින් 2009 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් 31 දක්වා සියයට 01 ක බලපත්‍ර ගාස්තු අයකරගෙන නොතිබුණි.

(ආ) 2017 වර්ෂය සඳහා ව්‍යාපාර බදු ගෙවිය යුතු ආයතන පිළිබඳ සමීක්ෂණයක් කර බදු ගෙවූ බව තහවුරු කර ගෙන නොතිබුණි.

(ඇ) පරිසර බලපත්‍ර ලබාගෙන තිබුණු ව්‍යාපාර 27 කින් ව්‍යාපාර බදු මුදල් රු. 81,000 ක් අයකරගෙන නොතිබූ අතර පරිසර බලපත්‍ර ලබාගත යුතු ආයතන 12 කින් බලපත්‍ර ලබා නොගැනීම නිසා රු.48,000 ක ආදායමක් අහිමිව තිබුණි.

2.2.6 වෙනත් ආදායම්

-------------------

(අ) දැන්වීම් පුවරු ගාස්තු

-------------------------

ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු අයකිරීමට අතුරු ව්‍යවස්ථා පනවා නොගෙන තාවකාලික දැන්වීම් පුවරුවක් සඳහා වර්ග අඩියකට රු.10 ක් හා ස්ථාවර ප්‍රචාරක දැන්වීම් පුවරුවක් සඳහා වර්ෂයකට වර්ග අඩියකට රු.50 ක් බැගින් රු. 76,560 ක ගාස්තු අයකර තිබුණි.

(ආ) ලෙලන තලන යන්ත්‍රය (වෛබ්‍රේටින් රෝල) කුලියට දීම

-------------------------------------------------------------

සභාව සතු ලෙලන තලන යන්ත්‍රය ගිවිසුමකින් තොරව 2016 සැප්තැම්බර් 22 දින සිට 2017 අගෝස්තු 25 දින දක්වා කුලී පදනම මත පෞද්ගලික කොන්ත්‍රාත් සමාගමකට ලබා දී තිබූ අතර

2018 පෙබරවාරි වනවිට මෙම යන්ත්‍රය, සංවර්ධන කටයුතු නවතා දමා තිබූ මාර්ගයක නිශ්කාර්යයව හා අනාරක්ෂිතව නවතා තබා තිබුණි. පසුව සභා වියදමින් යන්ත්‍රය ආපසු ගෙන්වා සේවා කර නැවත කුලියට ලබා දී තිබූ අතර කාලපරිච්ඡේදයට අදාලව කුලී වශයෙන් රු. 261,450 ක් අයකර ගෙන නොතිබුණි. 2016 සැප්තැම්බර් සිට 2017 අගෝස්තු දක්වා කාලයට අදාල රු. 521,450 ක කුලී ආදායම හා යොදන ලද ඉන්ධන සඳහා වැයකළ රු.142,500 ක මුදල තහවුරු කර ගැනීම සඳහා ධාවන විස්තර ඉදිරිපත්කර නොතිබුණි.

2.2.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු

---------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු. 9,958,326 ක් හා මුද්දර ගාස්තු රු. 20,900,000ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

3.1 කාර්යසාධනය

------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 22 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වනවිට කාරණා 04 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණු අතර කාරණා 15 කට අදාලව මධ්‍යම රජයේ, පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථා අනුව කටයුතු කර තිබුණි.

(ii) දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ මාර්ගවල රථවාහන නතර කිරීම හා කාර්යාල රථවාහන හැසිරවීම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා පනවා තිබුණද , එම අතුරු ව්‍යවස්ථාවට අනුව කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුල වාහන නැවතුම්පොල ගාස්තු කිසිවක් අයකර නොතිබුණි.

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සභාව විසින් 2017 වර්ෂය වනවිට දිගලවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ ඉදිකිරීම් වෙනුවෙන් රු. 26,381,708 ක සමස්ථ වියදමක් දරා තිබුණු අතර ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන ඇගයීමේ තරඟයේදී සබරගමුව පළාතෙන් දෙවන ස්ථානයත්, කැගල්ල දිස්ත්‍රික්කයෙන් ප්‍රථම ස්ථානයත් හිමි වී තිබුණි. ප්‍රතිචක්‍රීයකරණය කළ නොහැකි කසළ සභාවට ගැටළුවක්ව පවතින බැවින් තාවකාලික විසඳුමක් ලෙස අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ වැලලීම සිදුකර තිබුණි.

(ii) දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට අයත් වරිපනම් ඒකක 2,101 ආවරණය වන පරිදි කොට්ඨාශ 05 කින් කසළ එකතු කිරීම සිදු නොකරන අතර ඒ පිළිබඳ මහජන පැමිණිලි හා විරෝධතා ඉදිරිපත් වී තිබුණි.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක
-----------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 මැයි වනවිටත් සකස් කර නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------

(අ) ගොඩනැගිලි අයදුම්පත් අනුමත කිරීම
------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2007 වර්ෂය සිට 2016 වර්ෂය දක්වා නව ඉදිකිරීම් සඳහා ගොඩනැගිලි අයදුම්පත් 802 ක් ඉදිරිපත් වී තිබූ නමුත් එකී කාලපරිච්ඡේදය සඳහා අනුකූලතා සහතික 106 ක් පමණක් නිකුත් කර තිබුණි. අනුකූලතා සහතික නිකුත් කිරීම සියයට 18 ක් වැනි අඩු මට්ටමක පැවතුණි.

(ii) නව ඉදිකිරීම් සඳහා අනුකූලතා සහතිකයක් ලබාදී නව තක්සේරුවක් කර වරිපනම් බදු අයකල යුතු වුවත් 2016 හා 2017 වර්ෂවල අනුකූලතා සහතික නිකුත් කරන ලද දේපල 06 ක් සඳහා පැරණි දේපලේ ස්වභාවය මත වරිපනම් බදු අයකර තිබුණි.

(ආ) ඉඩම් කට්ටි කර විකිණීම
----------------------------

2013, 2015 හා 2016 වර්ෂවල ඉඩම් කට්ටි කර විකිණීම සඳහා අනුමැතිය ලබා දී තිබූ ඉඩම් 6 කින් ඇස්තමේන්තු වටිනාකම මත සියයට එකක බදු මුදල් අයකර තිබූ නමුත් ඉඩම් කට්ටිවල විකුණුම් වටිනාකම මත බදු අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

3.3 වත්කම් කළමනාකරණය
-----------------------------

(අ) පවරා නොගත් වත්කම්
-------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සභාවට අයත් සුසාන භූමි පිළිබඳ විස්තර අනුව සුසාන භූමි 13 ක් පිළිබඳව තොරතුරු අනාවරණය වුවද සුසාන භූමි 05 ක් පිළිබඳ පසු විපරම් කර අවශ්‍ය පවරාගැනීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) සබරගමුව පළාත් සභාවට අයත් වාහන 11 ක හා පළාත් පාලන අමාත්‍යාංශයට අයත් වාහන 02 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වත්කම් වලින් ආදායම් ලබා නොගැනීම
--------------------------------------------

සුසාන භූමි 09 කට අදාලව එළදා බදුදීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වත්කම් ලේඛනගත නොකිරීම

-----------------------------------

සුසාන භූමි ලිපි ගොනුවල භූමි ප්‍රමාණය, එළදාව පිළිබඳ විස්තර , ගස් පිළිබඳ විස්තර, මාර්ග සටහන් හා ගොඩනැගිලි යනාදි පොදු තොරතුරු එකතු කර යාවත්කාලීන කර නොතිබුණි.

(ඈ) නිශ්ක්‍රීය හා ඌන උපායෝජිත වත්කම්

-------------------------------------------

සභාවට අයත් වාහනයක් 2011 ජූලි සිට නිශ්ක්‍රීයව තිබූ අතර වාහන 11 ක් 2017 වර්ෂය තුල ධාවනයේ යොදවා නොතිබුණි. ඉන් වාහන 3 ක් 2016 හා 2017 වර්ෂවල අලුත්වැඩියාවට යොමු කර තිබූ නමුත් 2018 මැයි 31 දින වනවිටත් අලුත්වැඩියාව නිමකර නොතිබුණි.

3.4 ප්‍රසම්පාදන සැලැස්ම

------------------------

සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

3.5 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

(අ) අල්ගොඩ මාර්ගය ගංවතුරෙන් පිළිසකර කිරීම

----------------------------------------------------

**(i)** මැනුම්පතට අනුව මාර්ගයේ කොන්ක්‍රීට් ගැඹුර අඟල් 05 ක් ලෙස සලකා මැනුම්කර ගෙවීම් සිදුකර තිබූ අතර භෞතික පරීක්ෂාවේදී මාර්ගයේ ගැඹුර අඟල් 3 ½ ත් 4 ත් අතර පැවතුනි. මාර්ගයේ ගැඹුර අඟල් එකක් අඩුවෙන් කොන්ක්‍රීට් කිරීම මත කොන්ක්‍රීට් කියුබ් 7.37 ක් සඳහා රු. 309,327 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**(ii)** මැනුම්පතට අනුව මාර්ගයේ ABC ගැඹුර අඟල් 03 ක් ලෙස සලකා මැනුම්කර ගෙවීම් සිදුකර තිබූ අතර නියදි භෞතික පරීක්ෂාවේදී ABC දමා නොතිබුණි. මේ නිසා ABC දමා නොතිබියදී කියුබ් 22.12 ක් සඳහා රු.214,412 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) කහනාවිට මාහිංකන්ද මාර්ගය

-----------------------------------

**(i)** මැනුම්පතට අනුව මාර්ගයේ කොන්ක්‍රීට් ගැඹුර අඟල් 05 ක් ලෙස සලකා මැනුම්කර ගෙවීම් සිදුකර තිබූ අතර භෞතික පරීක්ෂාවේදී මාර්ගයේ ගැඹුර අඟල් 3 ½ ත් 4 ½ ත් අතර පැවතුනි. මාර්ගයේ ගැඹුර අඟල් බාගයක් අඩුවෙන් කොන්ක්‍රීට් කිරීම මත කොන්ක්‍රීට් කියුබ් 8.38 ක් සඳහා රු. 398,243 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**(ii)** මැනුම්පතට අනුව මාර්ගයේ ABC ගැඹුර අඟල් 04 ක් ලෙස සලකා මැනුම්කර ගෙවීම් සිදුකර තිබූ අතර නියදි භෞතික පරීක්ෂාවේදී ABC දමා නොතිබුණි. මේ නිසා ABC දමා නොතිබියදී කියුබ් 63.9 ක් සඳහා රු.719,873 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**(iii)** ගිවිසුම්ගත කොන්ත්‍රාත්කරු වන සබරගමුව පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය විසින් ගිවිසුම්වලට පටහැනිව උප කොන්ත්‍රාත් ලබා දී තිබුණි.

4. ගිණුම කටයුතු භාවය හා යහපාලනය

-----------------------------------------

4.1 මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන 2017 මැයි 23 දින ද ඉකුත් වර්ෂයට අදාල මුල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 01 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

4.2 අයවැය පාලනය

-----------------

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය මගින් ප්‍රතිපාදන වෙන්කර තිබුණු වැය විෂයන් 08 ක එකතුව රු. 2,517,000 ක ප්‍රතිපාදන සියයට 100 ක් ද වැය විෂයන් 04 ක ඉතිරි ප්‍රතිපාදන එකතුව රු. 498,319 ක් සියයට 68 ත් සියයට 96 ත් අතරද වශයෙන් එකතුව රු. 3,015,319 ක් උපයෝජනය කර නොතිබුණි.

5. පද්ධති හා පාලන

------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) අත්තිකාරම් ලේඛනය නිසි පරිදි යාවත්කාලීන නොකිරීම |
| | | (ii) අවිනිශ්චිත ගිණුමේ දිගුකාලයක සිට පවතින ශේෂය නිරවුල් නොකිරීම |
| (ආ) | ආදායම් පරිපාලනය | (i) වරිපනම් සඳහා දේපල තක්සේරුව නියමිත පරිදි නොකිරීම |
| | | (ii) හිග ආදායම් අයකර ගැනීමට නීතිමය කටයුතු නොකිරීම |
| | | (iii) ව්‍යාපාර හා කර්මාන්ත සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් නොපැවැත්වීම |
| (ඇ) | අයවැය පාලනය | (i) ඇස්තමේන්තු ප්‍රතිපාදන වල සැලකිය යුතු ඉතිරියක් තිබීම |
| | | (ii) ඇස්තමේන්තුගත ආදායම් අයකර නොගැනීම |
| (ඈ) | වාහන පාලනය | (i) දෛනික ධාවන සටහන් ඉදිරිපත් නොකිරීම |
| | | (ii) වාහන වල ඉන්ධන පරික්ෂාව සිදු නොකිරීම |